## ආයෝජන සම්බන්ධයෙන් වූ ප්‍රධාන වකාලා ගිවිසුම

(මෙහි මින්මතු “මුවක්කිල්” යනුවෙන් සඳහන් කරනු ලබන) ............................................ පදිංචි .................................... යන අය (නම) සහ (මෙහි මින්මතු “වාකිල්” යනුවෙන් සඳහන් කරනු ලබන) ස්වකීය ලියාපදිංචි කාර්යාලය අංක. 40, නවම් මාවත, කොළඹ 02 යන ලිපිනයේ පිහිටා ඇත්තා වූ ද, ලියාපදිංචි අංක. PQ 27 දරන සහ ශ්‍රී ලංකාවේ නීති යටතේ යථා පරිදි සංස්ථාගත කර ඇති සමාගමක් වූ ද **නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී** යන ආයතනය විසින් සහ ඔවුන් අතර මෙම ප්‍රධාන වකාලා ගිවිසුම සකස් කර ලියා අත්සන් කරනු ලැබේ. මෙම ගිවිසුම මගින් පහත දැක්වෙන පරිදි මෙයින් එකඟව සිටිනු ලැබේ.

### 1. පූර්විකාව

මෙම ගිවිසුමේ සඳහන් නියම සහ කොන්දේසි ප්‍රකාරව සහ ඉස්ලාම් ශරියා රීති සහ මූලධර්මවලට අනුකූලව වාකිල් භාණ්ඩාගාර අරමුදල් සංචිතය හරහා සහ එහි කොටසක් වශයෙන් ශරියා අනුකූලතා ගනුදෙනුවල මුවක්කිල් අරමුදල් අයෝජනය කිරීම සම්බන්ධයෙන් මුවක්කිල් නියෝජිත වශයෙන් වාකිල් පත් කිරීම සඳහා මුවක්කිල් විසින් අපේක්ෂා කරන **හෙයින් ද;**

### 2. වකාලා නියම සහ කොන්දේසි

2.1 මුවක්කිල් අරමුදල් ආයෝජනය කිරීම පිණිස මුවක්කිල් විසින් ස්වකීය නියෝජිත වශයෙන් වාකිල් පත් කර සිටියි. මුවක්කිල් වෙනුවෙන් සහ මුවක්කිල්ගේ ගිණුම සම්බන්ධයෙන් ශරියා අනුකූලතා ගනුදෙනු සඳහා ඇතුළත්වීමට වාකිල් වෙත මෙයින් බලය පවරා සිටිනු ලැබේ.

2.2 වාකිල්ගේ චේතනාන්විත විෂමාචර හෝ බරපතල පැහැර හැරීම් හේතුවෙන් උපචිතවන අවදානම් හැර, මුවක්කිල්ගේ නියෝජිත වශයෙන් වාකිල් විසින් සිදු කරන ක්‍රියාවලට ආශ්‍රිත සියලු අවදානම් මූලික වශයෙන් මුවක්කිල් විසින් දරනු ලැබිය යුතු වේ.

2.3 මේ යටතේ වූ ස්වකීය සේවා සැපයීමේ කාර්ය සඳහා, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වාකිල් වෙත හිමිකම් තිබිය යුතු ය; එනම් -

(අ) අර්පනයක නිශ්චිතව දක්වා ඇති වකාලා ගාස්තු සම්බන්ධයෙන්; සහ

(ආ) අර්පනයක් ප්‍රකාරව ප්‍රමාණවත් ලාභ උත්පාදනය කර ඇත්නම්, දිරිදීමනා ගාස්තුව සම්බන්ධයෙන්.

2.4 ප්‍රකාශිත කාලසීමාව සඳහා සහ ආයෝජන ඉල්ලුම්පත්‍රයේ/ ඉල්ලුම්පත්‍රවල එකඟ වී ඇති ආකාරයට වකාලා ආයෝජනය/ආයෝජන සංචිතයෙහි ආයෝජනය කරනු ලැබේ. එසේ වුව ද, මුවක්කිල් (ගනුදෙනුකරු) විසින් වාකිල් (බැංකුව) වෙත පටහැනි ආකාරයෙන් කැමැත්ත ලබා දී ඇත්නම් මිස, වකාලා ආයෝජනය/ ආයෝජන, සමාන කාලසීමාවක් සඳහා, එම ආයෝජන සිදුවන කාලයේ බලපවත්නා නියම සහ කොන්දේසි මත, සෑම කාලසීමාවක් අවසානයේදීම ස්වයංක්‍රීයව ප්‍රති-ආයෝජනය වනු ඇත.

**3 වකාලා ගනුදෙනු ක්‍රියාත්මක කිරීම**

3.1 අර්පනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට අදාළ ආයෝජන දිනය මත පදනම්ව මුවක්කිල් විසින් වකාලා මුදල ගෙවනු ලැබිය යුතු වේ.

3.2 මුවක්කිල් බලයලත් අත්සන්කරුවන් විසින් අන්‍යාකාරයකින් උපදෙස් ලබා දී ඇත්නම් මිස, (රැඳවුම් බදු වැනි අදාළ නීතිය ප්‍රකාරව රඳවා තබනු ලබන යම් මුදල් ප්‍රමාණයක් අඩු කිරීමෙන් පසුව), මුවක්කිල් විසින් 3.1 වගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට යටත්ව, වකාලා ගනුදෙනුවල කල් පිරීමේ ප්‍රතිශ්ඨා මුදල් කල් පිරීමේ දිනයේ දී මුවක්කිල් ගිණුම වෙත පවරනු ලබන බවට වාකිල් විසින් ප්‍රතිඥා දී සිටියි. එම පැවරීමෙන් පසුව, වකාලා ගනුදෙනුව අවසන් වන්නේ ය.

3.3 සැක දුරුකිරීමේ කාර්ය සඳහා, අර්පනයේ සඳහන් කර ඇති මුදලින් වකාලා මුදල ආපසු ගෙවීම හෝ අපේක්ෂිත ලාභ ගෙවීම සම්බන්ධයෙන් වකාලා කිසිදු ආකාරයකින් සහතික කර නොසිටින බවත් නිශ්කාශනය වන වකාලා ලාභය පළමු උපලේඛනයේ අර්පනයේ සඳහන් කර ඇති මුදලින් වෙනස් විය  හැකි බවටත් ප්‍රකාශ කර සිටිනු ලැබේ. කල් පිරීමේ ප්‍රතිශ්ඨා මුදල් සඳහා පමණක් මුවක්කිල් හිමිකම් ලබන්නේ ය.

3.4 එක් එක් වකාලා ගනුදෙනුවේ ව්‍යවහාර මුදල අර්පනයේ පාර්ශ්ව දෙකම විසින් එකඟ වූ ආකාරයට විය යුතු ය.

3.5 ප්‍රතිග්‍රහණයේ දී මුවක්කිල් විසින් වකාලා වෙත අන්‍යාකාරයකින් උපදෙස් ලබා දී ඇත්නම් මිස, අලුත් කිරීමේ අවස්ථාවේ දී පවතින නියම සහ කොන්දේසි මත වකාලා ගනුදෙනුව ස්වයංක්‍රීයව අලුත් විය යුතු ය. ප්‍රතිග්‍රහණය අත්සන් කරනු ලබන දිනයේ දී අත්කර ගන්නා ලද සහ වෙන් කරන ලද අපේක්ෂිත ලාභය අලුත් කරන ලද වකාලා ගනුදෙනුවට එකතු කිරීම සඳහා වූ විකල්පය මුවක්කිල් විසින් තෝරා ගනු ලැබිය හැකි ය.

**4 පාලනය වන නීතිය සහ අධිකරණ බලය**

**4.1** මෙම ගිවිසුම සියලු ආකාරයෙන්ම ශ්‍රී ලංකාවේ නීතිය ප්‍රකාරව පාලනය වන්නේ ය.

4.2 මෙම ගිවිසුම තුළින් හෝ ඒ හා සම්බන්ධයෙන් උපචිත වන නඩු කටයුතුවල කාර්ය සඳහා මෙම ගිවිසුමේ පාර්ශ්වකරුවන් විසින් ශ්‍රී ලංකාවේ අධිකරණවල අනන්‍ය අධිකරණ බලය වෙත අදාළ නඩු කටයුතු ඉදිරිපත් කර සිටින බවට මෙයින් ප්‍රකාශකර සිටියි.

**5 ගිවිසුම අවසන් කිරීම**

5.1 මෙම ගිවිසුම පාර්ශ්ව දෙකම විසින් ක්‍රියාත්මක කරනු ලබන දිනයේ සිට බලපැවැත්වෙන අතර එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වය වෙත මෙම ගිවිසුම අවසන් කිරීම පිළිබඳව දින 30 කට වඩා අඩු නොවන කාලයක ලිඛිත නිවේදනයක් ලබා දීම මගින් යම් පාර්ශ්වයක් විසින් මෙම ගිවිසුම අවසන් කරනු ලබන්නේ නම් සහ එසේ අවසන් කරනු ලබන තෙක් මෙම ගිවිසුම අඛණ්ඩව පවතින්නේ ය.

5.2 වකාලා මුදල කල් පිරීමට පෙරාතුව ආපසු ලබා ගැනීම සඳහා වාකිල් විසින් ස්වකීය පරම අභිමතය පරිදි ඉඩ දෙනු ලැබිය හැකි නමුත් එම උපදෙස් මුවක්කිල් විසින් ලබාදිය යුතු අතර අපේක්ෂිත ලාභය ඇතුළු එවැනි සියලු කල් පිරීමට පෙරාතුව මුදල් ආපසු ලබා ගැනීම් සහ ආශ්‍රිත අදාළ ලාභ තක්හාරුජ් මූලධර්ම මත අන්‍යෝන්‍ය එකඟත්වයක් මගින් තීරණය කරනු ලැබේ.

**මෙම ගිවිසුමට සාක්ෂි වශයෙන්** පිළිවෙලින් වූ ස්ථාවල දී සහ පහත නිශ්චිතව දක්වා ඇති දිනවල දී මෙහි මින්මතු සඳහන් කරනු ලබන ආකාරයෙන් මෙම ගිවිසුමේ පාර්ශ්වකරුවන් විසින් මෙම ගිවිසුම පිටපත් දෙකකින් ලියා අත්සන් කිරීමට කටයුතු සලස්වන ලදී.

| | |
|---|---|
| බලයලත් අත්සන්කරුවන් | ගනුදෙනුකරුගේ/ගනුදෙනුකරුවන්ගේ අත්සන |

නම:-

EPF අංකය

දිනය:-

නම

ජා.හැ. පත්/ වි. ගමන් බලපත්‍ර අංකය:-

දිනය:-

**සාක්ෂි**

1. ..............................................................

2. ......................................................................